**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2018**
**------------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරියේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණපහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**<br>2018 වර්ෂයේදී අධිකාරියේ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය රු.38,915,343 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් වශයෙන් හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ආයෝජනය ක්‍රියාකාරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2018 වර්ෂයේ අධිකාරියේ ප්‍රත්‍යාගණ ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතට එකතුකර ඇති අතර නැවත ආයෝජන ක්‍රියාකාරකම්වලින් එය අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම නිසා සිදුවූ ප්‍රමාද දෝෂය නිවැරදි කර 2019 සංසන්දනාත්මක මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ඉදිරිපත් කරමි . | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ සේවක ප්‍රසාද දීමනා වශයෙන් රු.7,507,875 ක් 2019 වර්ෂයේදී ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | 2018 සේවක ප්‍රසාද දීමනා සඳහා අනුමැතිය මහා භාණ්ඩාගාරය වෙතින් ලැබී ඇත්තේ 2019 මැයි 23 දිනය. ඒ වන විට 2018 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් 2018 වර්ෂයේ ප්‍රසාද දීමනා වෙන් නොකිරීම් නිසා ඇතිවූ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර 2019සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) අධිකාරියේ 2018 වර්ෂයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් ඉටු කරවා ගැනීමට අධිකාරිය විසින් ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා දෙපාර්ශවය අතර එකඟතාවයන්ට එළඹ නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් රු.2,150,000 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් ජංගම වගකීම් හා පුහුණු කිරීම් හා සම්මන්ත්‍රණ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සේවකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා කොට කාර්යක්ෂම කඩඉම් විභාගයක් පැවැත්වීම සඳහා 2,150,000ක මුදලක් ඇස්තමේන්තු වශයෙන් සකස්කොට එම ආයතනය මෙම ක්‍රියාවලිය සිදුකරයි යන වගකීම මත මෙම මුදල උපචිත වියදම් ලෙස ගලපන ලෙස මූල්‍ය අංශය වෙත උපදෙස් දෙන ලදී .කෙසේ වෙතත් සංවර්ධන පරිපාලන ආයතනයට මෙවැනි කාර්යක්ෂම කඩඉම් විභාගයක් පැවැත්විය නොහැකි බව දැනුම් දුන් බැවින් උපචිත වියදම් වැයකිරීමට අධිකාරියට හැකියාවක් නොලැබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 98,417,594 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.63,112,780 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,304,814 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ජනිත වූ රු.38,915,343 ක්වූ ලාභය මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ මානව සම්පත සාර්ථකව උපයෝගී කරගෙන තිබේද යන්න පරීක්ෂා කර ගැනීමේ අරමුණින් මානව සම්පත් විගණනයක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනය සමඟ 2016 දෙසැම්බර් 02 දින ගිවිසුම් ගත වී තිබුණි. ඒ සඳහා එම ආයතනයට 2017 අප්‍රේල් 20 දින රු. 219,000ක්වූ අත්තිකාරම් ගෙවා තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව අත්තිකාරම් ගෙවූ දින සිට මාස 03ක කාලයකදී කාර්යය නිමකල යුතු වුවද විගණන දින වන 2019 ජූලි 31 දින විටත් එම කාර්යය නිම කර නොතිබුණි. | ගෙවා ඇති මුදලට අනුකූල වන ආකාරයට අවශ්‍ය වාර්තාවක් ලබාගැනීමට කටයුතු දැනටමත් සිදුකර ඇත . | නියමිත කාලසීමාව තුළදී අදාල කාර්යය නිම කරවා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 39(2) වගන්තිය ප්‍රකාරව අදාල අමාත්‍යවරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව සඳහා සමාජිකයන් තිදෙනෙකු පත් කළ යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විට පත් කර තිබුණේ සමාජිකයන් දෙදෙනෙකු පමණි. පනතේ 19 වගන්තිය යටතේ සභාව වෙත යොමු කරන කරුණු සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු මාස 02න් ඇතුළත නිමකර වාර්තා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2017 වර්ෂයේ | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාව සඳහා සියළුම සාමාජිකයින් වර්තමානයේ පත්කර ඇති බව සඳහන් කරමි. එම සභාව විසින් විමර්ශන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් 06න් වාර්තා දෙකක් එනම් සහල් සඳහා උපරිම සිල්ලර මිල සම්බන්ධ විමර්ශන කටයුතු සහ අභ්‍යාස පොත් සඳහා උපරිම සිල්ලර මිල සම්බන්ධ විමර්ශන කටයුතු සම්පූර්ණ කර ඇති අතරම ඉතිරි වාර්තා කඩිනමින් අවසන් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 39(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කළ විමර්ශන කටයුතු 04ක් සම්බන්ධයෙන් විමර්ශන වාර්තා 2019 මාර්තු 31 දින වන විටත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එහි ප්‍රමාද කාලය මාස 03 සිට අවුරුදු 1 ½ දක්වා පැවතුනි. | | |
| (ආ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වනවිට වසර 15 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත අදාළ සංශෝධන කටයුතු සියල්ලම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නිසියාකාරව අධ්‍යයනයට ලක්කොට අවසන් කර එය වර්තමානයේ නීතිපති දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. | නියමිත කාලසීමාව තුල පනත සංශෝධන කටයුතු නිම කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරී පනතේ 61(1) හා 61(2) වගන්ති අනුව යම් භාණ්ඩයක් ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට තරම් හේතු ඇති අවස්ථාවක භාණ්ඩ සාම්පල පරීක්ෂා කිරීම සඳහා අනුමත රස පරීක්ෂකවරයකු වෙත එම සාම්පල ඉදිරිපත් කිරීමට අධිකාරියට හැකියාව පවතී. රස පරීක්ෂකවරයා විසින් සිය වාර්තාව මාසයක් ඇතුළත අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රු.563,407 ක් වැය කරමින් අනුමත රස පරීක්ෂකවරු වෙත යොමු කර තිබුණු භාණ්ඩ සාම්පල් 46 න් සාම්පල් 08 ක් සම්බන්ධ වාර්තා විගණිත දිනය වන 2019 ජනවාරි 31 දින වන විටත් ලැබී නොතිබුණු අතර සාම්පල් 03 ක වාර්තා නිසි කාලසීමාව තුල ලැබී නොතිබුණි. | අදාල කාල සීමාව තුලදී සාම්පල පරීක්ෂා කර ඒවාට අදාළ වාර්තාවන් පිටස්තර රසායනාගාරවලින් ලබා ගැනීමට නොහැකි වේ. මෙය අධිකාරියේ පාලනයෙන් පිටස්තරයින් සිදුවන කරුණක් බැවින් මෙයට සුදුසු පියවරක් ලෙස අධිකාරියටම අනුයුක්ත රසායනාගාරයක සකස්කර ගැනීමට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ඉල්ලුම් කර ඇත .ඒ තුළින් මෙවැනි ප්‍රමාද දෝෂයක් ඉවත්කර ගැනීමට හැකියාවක් පවතින බව සඳහන් කළ හැකිය. | පනතේ 61(2) වගන්තිය අනුව ක්‍රියාත්මක විය හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2003 අංක 09 දරණ පාරිභෝගික අධිකාරි පනතේ 8(ඌ) වගන්තිය අනුව වෙළඳපල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පල කිරිම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණේ එක් අධ්‍යනයක් පමණි. එම අධ්‍යයන වාර්තා 2018 සැප්තැම්බර් 25 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර තිබුණු අතර අධිකාරිය විසින් එම වාර්තාවේ ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරිම ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. | අධිකාරිය විසින් දැනට මහජනතාව දැනුවත් කිරිම සඳහා විශේෂයෙන් වාර්තාවක් සකස් කල විට එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව එහි සංක්ෂිප්තය සහ නිර්දේශයන් ආධිකාරියේ වෙබ් අඩවියේ සහ මුහුණු පොතේ පළ කිරීමට මෙන්ම තවදුරටත් අත්පත්‍රිකා සකස් කොට ඒවා දිස්ත්‍රික් මට්ටමේ තිබෙන ශාඛාවලටද යැවීම තුළින් පොදු මහජනතාවට දැනගැනීමට අවස්ථාව සැලැස්වීමට දැනටමත් කටයුතු කර ඇත. | අධ්‍යයන වාර්තාවේ ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ විමර්ශණ නිලධාරීන් 193 කින් වැඩිවුවද, සමාලෝචිත වර්ෂයේදී වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 6 කින් අඩුවී තිබුණි. තවද දිස්ත්‍රික්ක 10 ක වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණු අතර එය සියයට 9 සිට සියයට 26 දක්වා පරාසයක පැවතුනි. මෙම දිස්ත්‍රික්ක 10 න් දිස්ත්‍රික්ක 06 කම අතිරික්ත නිලධාරීන් අනුයුක්ත කර තිබියදී මෙම පහත වැටීම සිදුවී තිබුණි | අතිරික්ත විමර්ශන නිලධාරීන් එම ස්ථානවලට ස්ථිර වශයෙන් අනුයුක්ත කර නොතිබුණු අතර ඔවුන් එම ස්ථානවල වැඩ පුහුණුවිම් වශයෙන් යොමු කර තිබූ බැවින් එකී නිලධාරීන්ගෙන් අධිකාරියට අවශ්‍ය දායකත්වය ලබාගැනීමට හැකිවන්නේ එම පුහුණු කාල සීමාව අවසානයේදී ඔවුන් අවශ්‍ය සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමෙන් පසුව බව සඳහන් කිරිමට කැමැත්තෙමි . වර්තමානයේ මෙම ක්‍රියාදාමය සම්පූර්ණ කර ඇති බැවින් මෙම නිලධාරීන්ගේ දායකත්වය ඉදිරියේදී ඇගයීමට ලක්කල හැකි බව අපගේ වැටහීමයි . | වැටලීම් ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කොළඹ, කළුතර, මාතර, රත්නපුර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල ජනගහණය හා වෙළඳසැල් ප්‍රමාණය අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා වැඩි වුවද සමාලෝචිත වර්ෂයේදී එම දිස්ත්‍රික් කාර්යාල සඳහා ලබා දී තිබුණු වැටලීම් ඉලක්කයක් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටලීම් 1010 කින් එනම් සියයට 16 කින් අඩු වී තිබුණි. | මෙම ඉලක්කගත වැටලීම්වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ වැටලීම් ඉලක්ක සඳහන් කිරීමේදී අදාළ දිස්ත්‍රික්කයට එම වැටලීම් සම්බන්ධ කිරීම සහ එම ඉලක්කගත වැටලීම් වඩාත් සාර්ථක මෙන්ම වටිනාකමක් එකතු කළහැකි, සමාජ සුභසිද්ධිය වර්ධනය කළහැකි වැටලීම් විය යුතු බැවින් එවැනි වැටලීම් සඳහා වැඩි කාලයක් වැයවන බැවින් අධිකාරිය මෙහිදි බලාපොරොත්තු වන්නේ සංඛ්‍යානමය ඉලක්කයන් නොව ගුණාත්මකභාවයෙන් උසස් ඉලක්කයන් පවතීද යන්නය .ඒ අනුව කාලය ඉතා අවශ්‍යවන බැවින් සංඛ්‍යානමය වශයෙන් වැටලීම් ඉලක්කයන්වල සාපේක්ෂ අඩුවීමත් සිදුවිය හැකිය. | වැටලීම් ඉලක්ක ලබාදීමේදී එක් එක් දිස්ත්‍රික්කවල ජනගහණය හා වෙළඳසැල් ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |
| (ඉ) පනතේ 61(1) (ආ) වගන්තිය ප්‍රකාරව යම් භාණ්ඩයක සාම්පල ලබා ගැනීමෙන් පසු සති 06 ක නොඉක්මවන කාලයක් සඳහා ඒ භාණ්ඩය විකිණීම හෝ විකිණීම සඳහා අනාවරණය කිරීමෙන් වලකින ලෙසට ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට විධානයක් නිකුත් කල හැකි වුවද සමාලෝචිත වර්ෂයේදී ලබාගත් සාම්පල 46 න් සාම්පල 16 කට අදාලව රස පරීක්ෂක වාර්තාව අනුව ප්‍රමිතිවලට අනුකූල නොවූ හා අහිතකර ද්‍රව්‍ය අඩංගුව තිබුණු භාණ්ඩ සාම්පල සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදන්නාට හෝ වෙළෙන්දාට එවැනි විධාන නිකුත් කර නොතිබුණි. | 61( 1) වගන්තිය ප්‍රකාරව යම් භාණ්ඩ සාම්පල ලබාගැනීමෙන් පසු සති 6ක කාලයක් සඳහා ඒ භාණ්ඩ විකිණීම හෝ විකිණීම සඳහා අනාවරණය කිරිමට අදාළ වන පැමිණිලිවලට සම්බන්ධ විධානයන් නිකුත් කිරිම පිළිබඳ ක්‍රියාවලිය ඊට අදාළ නිළධාරීන් දැනුවත් කරන ලදී .මේ හේතුවෙන් ඉදිරියේදී කිසිඳු අවස්ථාවක මෙවැනි විධානයන් නිකුත් නොකර සිටිම සිදු නොකර සිටිමට සිදුවන අවස්ථාවන් නොමැතිබව දන්වා සිටිමට කැමැත්තෙමි. | සාම්පල ලබා ගැනීමෙන් පසු සති 06 ක නොඉක්මවන කාලයක් සඳහා ඒ භාණ්ඩය විකිණීම හෝ විකිණීම සඳහා අනාවරණය කිරීමෙන් වලකින ලෙසට ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට විධානයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී ආනයනකරුවන් හා බෙදාහරින්නන්ගෙන් උපරිම මිල සහතික ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර 280 ක් අධිකාරිය වෙත ලැබී තිබුණු අතර එම අයදුම්පත්‍රවල | සමාලෝචිත වර්ෂයේදී ආනයනකරුවන්ගේ හා බෙදාහරින්නන්ගේ උපරිම මිල සහතික කිරිම සඳහා ආයතන 53කින් අයදුම්පත් 280ක් ලැබී තිබු අතර එම සෑම | ආනයනකරුවන් හා බෙදාහරින්නන්ගෙන් උපරිම මිල සහතික ලබා ගැනීම අධිකාරිය වෙත ලැබී තිබුණු අයදුම්පත්‍රවල සඳහන් ආයතන ඊට අදාල |

| | | |
|---|---|---|
| සඳහන් ආයතන ඊට අදාල ගබඩා අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කර තිබුණේ අයදුම්පත්‍ර 89 ක් පමණි. එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 32 ක් පමණි. | අයදුම්පතකටම අදාළ ගබඩා අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කොට ඒ අවශ්‍යා උපරිම මිල සහතිකය ලබාදීමට කටයුතු කර ඇත | ගබඩා අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාරිභෝගිකයන් විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු බව සඳහන් වේ. සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය වෙත පාරිභෝගික පැමිණිලි 2092 ක් ලැබී තිබුණු අතර ඉන් විසඳු හෝ විසඳා නොමැති පැමිණිලි සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගැනීමට හැකි දත්ත පද්ධතියක් ක්‍රියාත්මකව නොපැවතුණු අතර 2016, 2017 හා 2018 වර්ෂවලදී අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි 13 ක් විගණිත දිනය වන විටත් විසඳා අවසන් කර නොතිබුණි. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබෙන පැමිණිලි පිළිබඳ ඔබ ඉල්ලුම් කර ඇති ආකෘතියට අනුව සවිස්තරාත්මකව තොරතුරු හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරිමට අදාළ සියළු කරුණු මේ වසරේ සම්පූර්ණ කරමින් පවතින අතර මේ සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේදයක් අනුව දත්ත පද්ධතියක් සැකසීමටද කටයුතු කරමින් පවතී. | ලැබුණු පැමිණිලි, ඉන් විසඳු හෝ විසඳා නොමැති පැමිණිලි සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගැනීමට හැකි දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 අගෝස්තු 08 දින අනුමත කර තිබුණු අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසි සපුරා ගැනීමකින් තොරව අධිකාරි පනතේ 52 (1) වගන්තිය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගේ 2018 සැප්තැම්බර් 14 දිනැති ලිපියෙන් එකඟතාවය මත සභාපතිවරයා විසින් 2018 සැප්තැම්බර් 14 දින සිට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කර තිබුණි. | වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරී පනතේ (1)52වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමාට ඇති බලතල අනුව එම අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාල සුදුසු පුද්ගලයෙක් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කර එම නිර්දේශ කිරිම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කිරීමෙන් අනතුරුව සභාපතිවරයා විසින් අදාළ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම පිළිබද ලිපිය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කිරීම සිදුකර ඇත . | බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කොන්දේසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් විමර්ශන නිලධාරීන් 214 ක් බඳවාගෙන තිබුණු අතර විගණිත දින වන 2019 අගෝස්තු 31 දින වන විටත් නිලධාරීන් 38 කට අදාලව ඔවුන්ගේ සුදුසුකම් අදාල ආයතන වලින් තහවුරු කරගෙන නොතිබුණු අතර දිස්ත්‍රික්ක කාර්යාලවල පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා එම නිලධාරීන් දිස්ත්‍රික්ක කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී විමර්ශන නිළධාරීන් බඳවාගත් 214 දෙනාගේම අදාළ අවම සුදුසුකම් තිබේද යන්න මානව සම්පත් අංශය විසින් තහවුරු කර අවසන් කර තිබේ . | අදාල සුදුසුකම් අදාල ආයතන වලින් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විමර්ශන නිලධාරින් 406 ක් අධිකාරියේ එක් එක් දිස්ත්‍රික්ක කාර්යාල සඳහා අනුයුක්ත කිරීමේදී දිස්ත්‍රික්ක 08 ක නිලධාරින් 60 කගේ අතිරික්තයක්ද දිස්ත්‍රික්ක 16 ක නිලධාරින් 104 ක ඌනතාවයක් පවතින ලෙසට අනුයුක්ත කර තිබුණු අතර ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර තිබුණු විමර්ශන නිලධාරින් 98 කුගෙන් අධිකාරියේ කටයුතු ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී නවක බඳවාගත් විමර්ශන නිළධාරින් කිසිඳු දිස්ත්‍රික්කයකට අනුයුක්ත කිරිමක් සිදු නොවන ලදී .ඔවුන් එම දිස්ත්‍රික්කවලම රැකියා පුහුණුව සඳහා පමණක් යොදවා තිබූ අතර ඔවුන්ට නිසියාකාරව අනුයුක්ත කිරිමක් සිදු කරන ලද්දේ එම පුහුණුවෙන් පසුව මෙම වසරේ ජුලී මාසයේ සිට බව කරුණාවෙන් දන්වා සිටිමි . ඒ අනුව අතිරික්තයක් පැවතීම පුහුණුව ලබාගැනීම සඳහා පැවති දෙයක් මිස රාජකාරිමය කටයුතු සඳහා පවත්වා ඇති දෙයක් නොවන බව දන්වා සිටිමි. | විමර්ශන නිලධාරින්ගෙන් අධිකාරියේ කටයුතු ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |